**ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය - 2022**

---

ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2022 සැප්තැම්බර් 09 දිනැතිව ඇති කර ගත් අංක 4205-එස්ආර්අයි දරන මූල්‍ය ගිවිසුම සහ අංක 9229-එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපාති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම සහ රට පුරා සිටින දිළිඳු සහ අවදානමට ලක්විය හැකි ජනතාවගේ ජීවනෝපාය ආරක්ෂා කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 74,090.15 කට සමාන එ.ජ.ඩො. මිලියන 203.36 ක් වූ අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් එම මුදල මූල්‍යකරණය කිරීමට එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2022 සැප්තැම්බර් 09 දින ආරම්භ කර 2024 පෙබරවාරි 29 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

**1.3 මතය**

2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය කාර්යසාධනය

**2.1** ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පිළිබඳ මූල්‍ය ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකවරයාගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමෘද්ධි පොරොත්තු ලේඛනයේ ප්‍රතිලාභීන් සඳහා එක් පුද්ගලයෙකුට රු. 5,000 බැගින් ගෙවිය යුතු වුවද, විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනයට අනුව, සැප්තැම්බර් හා ඔක්තෝම්බර් මාසවලදී එක් පුද්ගලයෙකුට රුපියල් 5,000 කට වඩා අඩු මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. ප්‍රතිලාභීන් සඳහා එවැනි අඩුවෙන් ගෙවීම්වල එකතුව රු. මිලියන 187 ක් වී තිබුණි. | සමෘද්ධි පොරොත්තු ලේඛනය යටතේ එක් ප්‍රතිලාභියෙකුට 2022 සැප්තැම්බර් මාසයේදී රු. 4,700ක් ගෙවා ඇති අතර 2022 ඔක්තෝබර් මාසයේදී එක් ප්‍රතිලාභියෙකුට රු.3,000ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | අනුමත මුදල ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල සටහන අංක 01 යටතේ දක්වා ඇති පරිදි, දැනට සිටින සමෘද්ධි ප්‍රතිලාභීන්ට සමෘද්ධි දීමනා සහ අතිරේක දීමනාව (මුදල ඉහළ දැමීම) ගෙවීමට අදාළව, අදාළ දීමනාව, ප්‍රතිලාභීන්ගේ පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව අනුව, වෙන් වෙන් වශයෙන් වර්ගීකරණය නොකර, මුළු මුදල ලෙස දක්වා ඇත. | එකඟ විය. | නිවැරදි වර්ගීකරණය යටතේ දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට නොගෙවූ රු.මිලියන 614 ක් වූ මුදල සඳහා උපලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මුදල් ලෙස දක්වා තිබුණි. | මෙම මුදල් සමෘද්ධි බැංකුවලින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙන්වා ගත යුතුව තිබුණද, ඊට අදාළ උපලේඛනය මෙම දෙපාර්තමේන්තුවට යවා නැත. | ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව පිළිබඳව ඇමුණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.2 අරමුදල් උපයෝජනය කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකවරයාගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම එ.ජ.ඩො. මිලියන 203.36 ක් වූ අතර, 2022 වර්ෂයේදී සිදු කිරීමට නියමිත ක්‍රියාකාරකම් සඳහා එ.ජ.ඩො. මිලියන 172.12 ක ප්‍රතිපාදන එයට ඇතුළත්ව තිබුණි. කෙසේ වුවද, 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 55,930 කට සමාන එ.ජ.ඩො. මිලියන 153.7 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර එය 2022 වසර සඳහා ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 84 ක් පමණක් වී තිබුණි. | එකඟ විය. | අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා ද, වෙන් කරන ලද අරමුදල් උපරිම ලෙස උපයෝජනය කිරීම සඳහා ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇති එ.ජ.ඩො. මිලියන 200 ක ණය මුදලට අමතරව, අදාළ ව්‍යාපෘති කටයුතු මූල්‍යකරණය කිරීම සඳහා එ.ජ.ඩො. මිලියන 3 ක ප්‍රදානයක් ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. එම ප්‍රදානයෙන්, රු. මිලියන 212.55 කට සමාන එ.ජ.ඩො. මිලියන 0.58 ක ප්‍රතිපාදනයක් 2022 වර්ෂයේදී ලැබී තිබුණද, ඉටු කිරීමට නියමිත ක්‍රියාකාරකම් සඳහා එම ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවට 2022.12.16 දින රු. මිලියන 212.55 ක ප්‍රදාන අරමුදල ලැබී ඇත. කෙසේ වුවද, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති යෝජනාව සකස් කරමින් සිටි බැවින්, 2022 දෙසැම්බර් 31 දිනට පෙර ක්‍රියාකාරකම් අවසන් කර නොමැත. | අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා ද, වෙන් කරන ලද අරමුදල් උපරිම ලෙස උපයෝජනය කිරීම සඳහා ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් | විගණකවරයාගේ |
|---|---|---|

| | දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී ගොවීන්ට සහනාධාර ලබාදීම සඳහා එ.ජ.ඩො. මිලියන 22.04 කට සමාන රු. මිලියන 6,000 ක් වෙන් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයේ දී ගොවීන්ට සහනාධාර ලෙස ලබා දී තිබුණේ රු. මිලියන 127.02 ක් හෙවත් ප්‍රතිපාදනවලින් සියයට 2.11 ක් පමණි. ඉතිරි රු. මිලියන 5,872.98 ජංගම වගකීම් යටතේ ගෙවිය යුතු සහනාධාර ලෙස දක්වා ඇත. | මෙම ව්‍යාපෘතිය යටතේ දිළිඳු සහ අවදානමට ලක්විය හැකි පවුල් සඳහා මුදල් මාරු කිරීම සහ ගොවීන් සඳහා මූල්‍ය ආධාර ලබා දීම ක්‍රියාත්මක කරනු ලැබුවේ 2022 වසර තුළ පමණි. | අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, ගර්භනී මව්වරුන් සඳහා පෝෂ්‍යදායි ආහාර ලබාදීම සහ කිරි දෙන කාන්තාවන් සහ වයස අවුරුදු දෙකට අඩු ළමුන් සඳහා පෝෂණ දීමනාව ලබා දීම 2022 වර්ෂයේ විදේශ ණය මූල්‍යකරණය යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ලෙස සඳහන් කර ඇත. රු.මිලියන 2,650 ක අයවැය ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, මෙම මුදල් ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතිය යටතේ අදාළ කටයුතු සඳහා යොදා නොගත් අතර එම මුදල් මු.රෙ. 66. මගින් වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට පෙර සමෘද්ධි බැංකුවේ ගැබිණි මව්වරුන්ගේ නව බැංකු ගිණුම විවෘත කිරීම අවසන් කර නොමැති බැවින්, ඉතිරි ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂයකට මාරු කර ඇත. තවද, බැංකු ගිණුම ආරම්භ කිරීම සඳහා උපදෙස් ලබා දී ඇති අතර චක්‍රලේඛයට අනුව, හඳුනාගත් ප්‍රතිලාභීන් සඳහා බැංකු ගිණුම් විවෘත කරන ලද අතර ගෙවීම් කිරීම අවසන් කර ඇත. | අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |